

වාර්ෂික වාර්තාව

2018

බුද්ධශාසන අරමුදල

අංක 135
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත
කොළඹ 07

දුරකථන - 0112303293
විද්‍යුත් තැපෑල- bsfund@mbs.gov.lk
වෙබ් අඩවිය - www.mbs.gov.lk/web/buddhasasana-fund

පටුන

	පිටු අංකය
01. බුද්ධශාසන අරමුදල	
1.1 දැක්ම	1
1.2 මෙහෙවර	1
1.3 අරමුණු	1
1.4 කාර්යභාරය	1
1.5නෛතික රාමුව	1-2
02. සංවිධාන ව්‍යුහය	**2**
03. කාර්ය මණ්ඩලය	3
04. අරමුදලේ කාර්ය සාධනය	
4.1 සාමණේර ආයතන පවත්වාගෙන යෑම සඳහා මූල්‍යාධාර ලබාදීම	3-4
4.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීම	5
4.3 දුෂ්කර විහාරස්ථාන සඳහා සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබාදීම	6-7
4.4 සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය	7-8
4.5චීන භාෂා පාඨමාලා පැවැත්වීම	8
4.6 භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන	8-9
4.7වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට ප්‍රායෝගික පුහුණුව ලබා දීම	9-10
05. ඉදිරි ඉලක්ක	10-11
06. මූල්‍ය කළමණාකරණය	
6.1ආදායම් වියදම් ගිණුම	12-13
6.2 ශේෂ පිරික්සුම	14-15
6.3 ශේෂ පත්‍රය	16
6.4 විගණකාධිපති වාර්තාව	17-24

01. බුද්ධශාසන අරමුදල

1.1 දැක්ම

බොදු පිළිවෙත් රකින, සාරධර්ම සපිරි ගුණගරුක දැහැමි සමාජයක් බිහිකිරීම.

1.2 මෙහෙවර

සම්බුදු ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාත්මික හා සමාජීය සංවර්ධනයට දායක වෙමින්, විහාරස්ථානයන්හි ප්‍රත්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමෙන් බුද්ධශාසනයේ ස්ථීර පැවැත්ම වෙනුවෙන් කටයුතු සිදු කිරීම.

1.3 අරමුණු

I. බුද්ධශාසනය ආරක්ෂා කිරීම සඳහා සුදුසු වැඩ සටහන් සිදු කිරීම.

II. බුද්ධශාසනය පෝෂණය කිරීම සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.4 අරමුදලේ කාර්යභාරය

1. සාමණේරයන් වහන්සේලා පස් නමකට වඩා සාමණේර අධ්‍යාපනය ලබා දෙන සාමණේර ආයතන සඳහා මාසික මූල්‍යාධාර පිරිනැමීම.

2. සාමණේර ආයතනවල සාමණේරයන් වහන්සේලාගේ දහම් දැනුම හා වත් පිළිවෙත් පිළිබඳ වාර්ෂික ඇගයීම.

3. දිවයින පුරා අඩු පහසුකම් සහිත විහාරස්ථානයන්හි භෞතික අවශ්‍යතා සපුරාලීම.

4. සම්බුද්ධත්ව ජයන්ති සාමණේර කැපකරු යෝජනා ක්‍රමය.

5. චීන භාෂා පාඨමාලා පැවැත්වීම.

6. භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.


7. වැඩිහිටිවියේදී පැවිදි බිමට ඇතුළත්වූ සහ තරුණ ස්වාමීන්වහන්සේලා සඳහා පැවිදි ප්‍රතිපදාවට අයත් වත්පිළිවෙත්, දහම් දැනුම ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම

1.5 අරමුදල පිහිටා ඇති නෛතික රාමුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය අනුව "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙහි හා 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදය මඟින් සියළුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂාකර දෙන අතර බුද්ධශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය" යන්න දැක්වේ.

එකී කාර්යභාරයට අනුව 1990 අංක 35 දරන පනතින් බුද්ධශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා අරමුදල් එකතුකිරීම හා සම්පාදනය කිරීම සඳහා බුද්ධශාසන අරමුදල ලෙස මෙම අරමුදල පිහිටුවා ඇති අතර බුද්ධශාසනය ආරක්ෂා කිරීමෙහි සහ පෝෂණය කිරීමෙහි නිරතව සිටින ආයතන කළමණාකරණයෙහිලා සහායවීම ද අරමුදලේ කාර්ය කරගෙනයාමට ආනුශාංගික වන හෝ හිතකරවන වෙනත් සියලු ක්‍රියාවන් සහ දේවල් කිරීම සඳහා බුද්ධශාසන අරමුදලකට යුතු කළයුතු වන බව එම පනතින් නියම කර ඇත.

02. සංවිධාන ව්‍යුහය



03. කාර්යය මණ්ඩලය

1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 7 (ඊ) හා 14 වැනි වගන්ති යටතේ පාලක මණ්ඩලය විසින් පනවනු ලබන නීතිවල සඳහන් පරිදි අරමුදලේ ප්‍රධාන විධායකයා ලෙස පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන ලේකම් වරයෙකු සිටිය යුතු අතර එම ලේකම්වරයා ගණන් දීමේ නිලධාරියාද වන අතර හැකි සෑම විටම බුද්ධශාසන අමාත්‍යාංශයට අනුයුක්ත රජයේ මාණ්ඩලික නිලධාරියෙකු අතරින් නම් කරගත යුතු බව දක්වා ඇත.

මේ අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු තම නිත්‍ය රාජකාරියට අමතරව මෙම ලේකම් තනතුරේ වැඩ බැලීම සිදු කරනු ලැබේ. එමෙන්ම අරමුදලේ ගණකාධිකාරී ලෙස අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වැඩ බැලීම සිදු කරනු ලබන අතර තම නිත්‍ය රාජකාරී වලට අමතරව අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය අරමුදලේ කටයුතු සඳහා සහාය වේ.

04.අරමුදලේ කාර්ය සාධනය

4.1 සාමණේර ආයතන සඳහා මූල්‍යාධාර ලබාදීමේ වැඩසටහන

ගිහි ජීවිතය අතහැර පැවිදි ජීවිතයට ඇතුළත් වන දරුවා කෙටි කාලයකින් පිරිවෙන් අධ්‍යාපනය වෙත යොමු කෙරේ. අතීතයේ පැවති ක්‍රමය වූයේ කුල දරුවෙකු වසර දෙක තුනක් විහාරස්ථානයක සිටීමින් පැවිදි ජීවිතය හා බණ දහම් පිළිබඳ අවබෝධය ලබා ගනිමින් සිය කැමැත්තෙන්ම පැවිදි ජීවිතයට ඇතුළු වීමයි. නමුත් වර්තමානයේ පැවිදි ජීවිතයට ප්‍රවේශ වන කුල දරුවන්ට සසුන්ගත වීමට පෙර පැවිදි ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඇති අවස්ථා අඩුය.

මෙම අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් බුද්ධශාසන අරමුදල පිහිටුවීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන හඳුනාගත හැකිවේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂූත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂු ජීවිතය පිළිබඳ යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත් පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වී තිබේ. දසධම්ම සූත්‍රයෙන් නිරූපිත සම්පූර්ණ භික්ෂූන් වහන්සේ නමක් සමාජයට දායාද කිරීම, භික්ෂූ ජීවිතය බෞද්ධ පිළිවෙත් අනුව සකස් වූ ජීවිතයක් බව අවබෝධ කර දීම, භික්ෂූන් වහන්සේ හා ගිහියා අතර වෙනස හා භික්ෂූත්වයේ උත්තරීතරභාවය අවබෝධ කරවීම, වෙනත් කෙනෙකුට බරක් නොවී භික්ෂූ ජීවිතය ගත කළ යුතු ආකාරය උගැන්වීම සාමණේර අධ්‍යාපනයෙන් සිදු කරනු ලැබේ.

ආධාර ලැබීමට තිබිය යුතු අවශ්‍යතා

I. දහම් පාසල හැරුණු විට වෙනත් අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන නොයනු ලබන විහාරස්ථානයක් විය යුතුය.

II. තුන් බෝධිය තිබිය යුතුය.

III. අධ්‍යාපනය ලබන සාමණේර හිමිවරුන් නේවාසිකව වැඩ විසිය යුතුය.

IV. නේවාසිකව වැඩ විසීම සඳහා අවශ්‍යවන ලැගුම් ගෙවල්, ජලය, විදුලිය, වැසිකිළි ආදි මූලික අවශ්‍යතා තිබිය යුතුය.

V. උදෑසන හා දවල් දානය ප්‍රමාණවත් පරිදි ලැබෙන දායක පිරිස් සහිත විහාරස්ථානයක් විය යුතුය.

VI. කුඩා සාමණේර හිමිවරුන් පුහුණු කරවීමට උගත්, සිල්වත් උපසපන් උපාධ්‍යායන් වහන්සේ නමක් සිටිය යුතුය.

2018 වසරේ මූල්‍යාධාර ලබා දුන් ආයතන

අනු අංකය	ආයතනය (නම/ලිපිනය)	ආයතනයේ සිටින සාමණේර හිමිවරු ගණන
01	කටුගස්තොට සුධම්මානන්ද සාමණේර ආයතනය	17
02	තල්දෙන මිහිඳු සාමණේර ආයතනය	06
03	ගුන්නෑපාන ශ්‍රී ධම්මපාල සාමණේර ආයතනය	09
04	ගාල්ල සිරිසුදස්සී සාමණේර ආයතනය	08
05	ගාල්ල විද්‍යාදීප සාමණේර ආයතනය	05
06	අමුණුගොඩ සිරිපැරකුම් සාමණේර ආයතනය	05
07	මහනුවර සිරි ධම්මරතන සාමණේර ආයතනය	09
08	ඇඹුල්පුර සම්බුද්ධාලෝක සාමණේර ආයතනය	08
09	දඹුල්ල ජිනරතන සාමණේර ආයතනය	11
10	හිරිපිටිය විද්‍යාවංශ සාමණේර ආයතනය	11
11	මිද්දෙනිය ශ්‍රී වජිරාරාම සාමණේර ආයතනය	12
12	තංගල්ල සිරි අරියවංශ සාමණේර ආයතනය	13
13	අඹගස්වැව විද්‍යාවංශ සාමණේර ආයතනය	13
14	කොටපොල සාරානන්ද සාමණේර ආයතනය	11
	එකතුව	138

4.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීමේ වැඩසටහන

බුද්ධශාසන අරමුදල පිහිටුවීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන පැහැදිලිව හඳුනාගත හැකි වේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂූත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂූන් වහන්සේගේ ජීවිතය පිළිබඳව යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත්පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වේ.

මෙකී අරමුණු ඔස්සේ පුරුදු පුහුණු වූ සාමණේර හිමිවරුන්ගේ දැනුම හා ආකල්ප පිළිබඳ පරීක්ෂා කර බැලීමක් මෙහිදී සිදු කෙරේ. ඒ අනුව, පුහුණුව ප්‍රමාණවත්ව ලැබීමෙන් පසු සෑම වසරක් අවසානයේ දී බුද්ධශාසන අරමුදල විසින් පවත්වනු ලබන වර්ෂ අවසාන විභාගයට සාමණේර භික්ෂූන් වහන්සේලාට පෙනී සිටිය හැකි වේ. මෙම ඇගයීමේ දී ලිඛිත පරීක්ෂණයක් මෙන්ම ප්‍රායෝගික හැකියාව පිළිබඳව පරීක්ෂණයක් ද නායක ස්වාමීන්වහන්සේලාගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කෙරේ. මෙම පරීක්ෂණයෙන් විශිෂ්ට හා අධිශ්‍රේණියේ සාමාර්ථ ලබා ගන්නා සාමණේරයන් වහන්සේලාට විශේෂ ඇගයීමක් බුද්ධශාසන අරමුදල මඟින් සිදු කෙරේ.

ක්‍රියාත්මක ක්‍රමවේදය

I. ලියාපදිංචි කර ඇති සාමණේර ආයතන වලින් විභාගය සඳහා අයදුම් පත්‍ර කැඳවීම
II. විභාග කටයුතු සංවිධානය කිරීම
III. විභාගය පැවැත්වීම
IV. ශිෂ්‍යත්ව ලබා දීම

2018 වර්ෂයේ පවත්වන ලද පරීක්ෂණය පිළිබඳ තොරතුරු

❖ **පරීක්ෂණය පැවැත්වූ ස්ථානය**	කැළණිය,පැලියගොඩ, විද්‍යාලංකාර පිරිවෙන
❖ **පැවැත්වූ දිනය හා වේලාව**	2018.12.25 (පෙ.ව 9.00 - ප.ව 3.00)
❖ **පරීක්ෂණයට පෙනී සිටි ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව**	56
❖ **වැය කළ මුදල**	රු. 506,535.00

4.3 දුෂ්කර විහාරස්ථානවල සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබාදීම.

දිවයින පුරා පිහිටි විහාරස්ථාන අතුරින් මූලික පහසුකම් වත් සම්පූර්ණ නොවූ විහාරස්ථාන රාශියක් දක්නටලැබේ.අවම පහසුකම් සම්පූර්ණ නොවූ එම විහාරස්ථානවල වැඩ වසන භික්ෂූන් වහන්සේලාට සනීපාරක්ෂක හා වෙනත් පහසුකම් දියුණු කරගැනීම සඳහා අවස්ථාව සලසාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

වර්ෂයකට එක් දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තෝරාගෙන එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ප්‍රමුඛතා ලේඛනය අනුව සැකසූ වාර්තාවක් අනුව විහාරස්ථාන තෝරාගැනීම හා සෘජුව බුද්ධශාසන අරමුදල මඟින් කෙරෙන ඉල්ලීම් ද ප්‍රාදේශීය ලේකම්/ බෞද්ධ කටයුතු සමායෝජකගේ නිර්දේශය සහිතව තෝරාගෙන පාලක මණ්ඩල අනුමැතියෙන් මූල්‍යාධාර ලබාදීම සිදුකෙරේ.

2018 වර්ෂයේදී සනීපාරක්ෂක පහසුකම් සඳහා මූල්‍යාධාර ලබාදුන් විහාරස්ථාන

අනු අංකය	විහාරස්ථානයේ නම	ලිපිනය	ලබා දුන් මුදල
1	ශ්‍රී ශාක්‍ය මුනින්දාරාමය	කපුවිට, පල්ලේගම, මොරොන්තොට	**100,000**
2	ශ්‍රී ධම්මදින්නාරාමය	දලුග්ගල, රඹුක්කන	**100,000**
3	ශ්‍රී නාගවනාරාම විහාරය	කොස්හින්න, වලල්ගොඩ, රඹුක්කන	**100,000**
4	ශ්‍රී බෝධිරුක්කාරාම විහාරය	ගඟේකුඹුර, රඹුක්කන	**100,000**
5	ශ්‍රී ඛෙත්තාරාම විහාරය	තල්දැව, රඹුක්කන	**100,000**
6	ශ්‍රී විද්‍යා ශ්‍රී මහා විහාරය	පරපේ, රඹුක්කන	**100,000**
7	ශ්‍රී වර්ධනාරාම විහාරය	වලල්ගොඩ, රඹුක්කන	**100,000**
8	ශ්‍රී නන්දනාරාම විහාරය	කන්දමුල්ල, දීවෙල, පල්ලේගම	**100,000**
9	ශ්‍රී තපෝවනාරාම විහාරය	උඩුකුඹුර, කොබ්බෑගල, ගලගෙදර	**100,000**
10	ශ්‍රී ශෛලතලාරාමය විහාරය	ගැටලෑව, ගලෙන්බිදුණුවැව	**100,000**
11	ශ්‍රී අභිනවාරාම විහාරය	වැටියපහලගම, ආනමඩුව	**100,000**
12	ශ්‍රී මහින්දරාම විහාරය	පැහැණියමැද්දර, අරණායක	**100,000**
13	ශ්‍රී සම්බුද්ධ ජයන්තිකාරාමය	තිස්සමල්වෙල, යටගම, රඹුක්කන	**100,000**
14	ශ්‍රී බෝධිරාජාරාම විහාරය	යටගම	**100,000**
15	දොඩම්දෙණිය පුරාණ විහාරය	කලන්නායක	**100,000**
16	ශ්‍රී සුගතවංශාරාම විහාරය	මල්වල, නවසේනපුර	**100,000**
17	ලංකාපුර රජමහා විහාරය	නෙළුවැව	**100,000**
18	ශ්‍රී ස්වර්ණගිරි විහාරය	බෝ අත්ත, වැලිකන්ද	**100,000**
19	ශ්‍රී සාම විහාරය	මඩකලපු පාර, සෙවනපිටිය	**100,000**

20	බෝධිමළු විහාරය	කුරුළුබැද්ද, නව මහසෙන්පුර	**100,000**
21	රීදි විහාරය	රීදි පොකුණ, නෙළුවවැව	**100,000**
22	නා සෙවණ ආරණ්‍ය සේනාසනය	මහවැව, සෙවනපිටිය	**100,000**
23	දක්ෂිණාගිරි විහාරය	මහවැව, සෙවනපිටිය	**100,000**
24	නාමල්ගම රජමහා විහාරය	නාමල්ගම, වැලිකන්ද	**100,000**
25	කන්දෙ විහාරය	කන්දකඩුව, සිංහපුර	**100,000**
26	ශ්‍රී සම්බෝධි කාශ්‍යාරාමය	3 වන පියවර, සෙවනපිටිය	**100,000**
27	ශාන්තිනිකේතනාරාමය	මහාවැව, මනම්පිටිය	**100,000**
28	ශ්‍රී සුසීල විහාරය	කැලියාවිල, වැලිකන්ද	**100,000**
29	ජයසේකරාරාමය	අසේලපුර, වැලිකන්ද	**100,000**
30	ශ්‍රී සුබෝධාරාමය	මගුල්පොකුණ, වැලිකන්ද	**100,000**
	මුළු මුදල		**රු. 3,000,000.00**

4.4 සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය

සම්බුද්ධත්ව ජයන්ති වර්ෂයට අදාළව හා 2010 වර්ෂයේ සිට පැවිදි වූ සාමණේර හිමිවරුන් සඳහා විශේෂ සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමයක් හා 2014 වර්ෂයේ සැප්තැම්බර් මාසයෙන් පසු පැවිදි වූ සාමණේර හිමිවරුන් සඳහාද මෙම ව්‍යාපෘතිය අදාළ වේ. මෙම ව්‍යාපෘතිය මඟින් ඉහත කාලය තුළ පැවිදි බිමට පත් සාමණේරයන් වහන්සේලාගේ අධ්‍යාපන කටයුතු සඳහා හෝ වෙනත් ප්‍රත්‍ය අවශ්‍යතා සඳහා මූල්‍යමය දායකත්වයක් ලබා දීම තුළින් උන්වහන්සේලාගේ ශාසන පැවැත්මට සහයක් ලබාදීම අපේක්ෂා කෙරේ. මෙම සාමණේර ශිෂ්‍යාධාර කැපකරු ක්‍රමයට තෝරාගනු ලබන්නේ පහත සඳහන් සුදුසුකම් ඇති සාමණේර හිමිවරුන්ය.

i. 2010 ජනවාරි 01 දින සිට 2013 වෙසක් සතියෙහි අවසාන දිනය දක්වාවූ කාලය තුළ පැවිදි කළ සාමණේර හිමිනමක් විය යුතුය.

ii. පැවිදි වන දිනට වයස අවුරුදු 18 ට අඩු විය යුතුය.

iii. පැවිදි වී මාස 3 ක් ගත වී තිබිය යුතුය.

iv. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ සාමණේර ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

v. එක් විහාරස්ථානයකින් උපරිම දස නමකි.

vi. 2014 සැප්තැම්බර් මාසයෙන් පසු පැවිදි වූ සියලු භික්ෂූන් වහන්සේලා මෙම ශිෂ්‍යාධාර ක්‍රමයට දායක කර ගැනීමට අපේක්ෂා කෙරේ.

සාමණේර ස්වාමීන් වහන්සේලා සඳහා වන සාමණේර කැපකරු ශිෂ්‍යාධාර යටතේ 2016 /08/ 10 වැනි දින පවත්වන ලද 76 වැනි පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි 2016 සැප්තැම්බර් මස සිට සාමණේර ස්වාමීන් වහන්සේලා සඳහා මසකට රු 700 බැගින් ගෙවීමට කටයුතු කර ඇත.

මෙම වසරේ ජනවාරි මස සිට සාමණේර කැපකරු ශිෂ්‍යාධාර ගෙවීම්යටතේ සාමණේර ස්වාමීන් වහන්සේලා සඳහා ලබා දී ඇති මුදල 5,937,659/= කි. මෙම මුදලට තැපැල් කාර්යාල කොමිස් මුදල් ද ඇතුළත්ව ඇත.

4.5 චීන භාෂා පාඨමාලා පැවැත්වීම.

ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලාගේ භාෂා ඥානය හා සංස්කෘතික අනන්‍යතාවයන් පිළිබඳව අධ්‍යයනය ඉතා වැදගත් වේ. විවිධ භාෂා හා සංස්කෘතීන් අතර වර්තමානයේ චීන භාෂාවට හා සංස්කෘතියට ප්‍රමුඛස්ථානයක් හිමිවේ. චීන භාෂාවෙන් උසස් අධ්‍යාපනයට අවස්ථාව උදා කර දෙමින් ථෙරවාදී හා මහායාන බුදු දහම පිලිබඳ තුලනාත්මක අධ්‍යයනයක් කිරීමට අවස්ථාව උදා කර දීම මෙම පාඨමාලා පැවැත්වීමේ අරමුණයි.

2018 වසරේදී පැවැත්වූ පාඨමාලාව පිළිබඳ තොරතුරු

ආයතනය	ලිපිනය	මුදල
චීන භාෂා හා සංස්කෘතික අධ්‍යයන ආයතනය	දෙහිමඩුව, මාවනැල්ල	රු.257,975.00

4.6 භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන

ශ්‍රී ලංකාව පුරා වැඩසිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් බුද්ධශාසන අරමුදල මඟින් ක්‍රියාත්මක කෙරේ. 2559 වෙනි වෛශ්‍යාකා්‍ය මංගල්‍ය නිමිති කොටගෙන දිවයින පුරා වැඩසිටින භික්ෂූන් වහන්සේලා රෝගාතුරවීම් වලදී අවශ්‍ය වන වෛද්‍ය පහසුකම් සඳහා ආධාර ලබාදීම මෙමගින් සිදුකෙරේ.

මෙහිදි දිවයින පුරා වැඩසිටින සුදුසුකම් ලත් භික්ෂූන් වහන්සේලාගෙන් ප්‍රාදේශීය ලේකම් හා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී හිමියන්ගේ නිර්දේශයෙන් හා වෛද්‍ය නිර්දේශය මත භික්ෂූන් වහන්සේලා වෙත වෛද්‍යාධාර ලෙස මසකට රු. 5000/= ක් හෝ 3000/= බැගින් වන මුදලක් ගෙවීම සිදුවේ.

2018 ඉල්ලීම් 21 ක් වෙනුවෙන් හා පූජ්‍ය වැල්ලම්පිටියේ ඉන්දරතන ස්වාමීන් වහන්සේට අක්ෂි ශල්‍යකර්මයක් සඳහා රු.80,000/= මුදලක්ද ගෙවා ඇත.

2018 වසරේදී ගෙවීම් කරන ලද වෛද්‍යාධාර පිළිබඳ තොරතුරු

අනු අංකය	ස්වාමීන් වහන්සේගේ නම	රෝගය
1	පූජ්‍යඨී. සුසීම හිමි	මාංශපේශී දියවීම
2	පූජ්‍ය ඩී. පේමරතන හිමි	අන්ධභාවය
3	පූජ්‍ය කේ. පේමරතන හිමි	දියවැඩියාව
4	පූජ්‍ය එස්. සුමංගල හිමි	හෘද රෝගය
5	පූජ්‍ය පී. නන්දරතන හිමි	අංශභාගය

6	පූජ්‍ය කේ. ඤානරතන හිමි	අන්ධභාවය
7	පූජ්‍ය ඩී. පුඤ්ඤරතන හිමි	අංශභාගය, පිලිකාව
8	පූජ්‍ය එන්. රාහුල හිමි	ස්නායු ආබාධ
9	පූජ්‍ය ඩී. අරියධම්ම හිමි	අධිරුධිර පීඩනය, දියවැඩියාව
10	පූජ්‍ය වැලමිට ධම්මානන්ද සිල් මාතාව	පිලිකා රෝගය
11	පූජ්‍ය එම්. තිලකසිරි හිමි	හෘද රෝගය
12	පූජ්‍ය ජී. මහින්ද හිමි	දියවැඩියාව
13	පූජ්‍ය එම්. විජිත හිමි	හෘද රෝග
14	පූජ්‍ය බී. විපුලසිරි හිමි	හෘද රෝග
15	පූජ්‍ය බී. නන්දාලෝක හිමි	හෘද රෝග
16	පූජ්‍ය යු. නන්දරතන හිමි	දියවැඩියාව
27	පූජ්‍ය ජී. සුමනනාග හිමි	දියවැඩියාව
18	පූජ්‍ය එස්. විමලවංශ හිමි	අධිරුධිර පීඩනය
19	පූජ්‍ය එස්. සද්ධාසීල හිමි	අධිරුධිර පීඩනය, දියවැඩියාව
20	පූජ්‍ය වයි. සුමංගල හිමි	දියවැඩියාව
21	පූජ්‍ය ඩබ්. ධම්මරතන හිමි	දියවැඩියාව
22	පූජ්‍ය ඩබ්. ඉන්දරතන හිමි	අක්ෂි රෝග

4.7වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට ප්‍රායෝගික පුහුණුව ලබාදීම.

වයස්ගතව පැවිදි ජීවිතයට ඇතුළත් වන ස්වාමීන් වහන්සේලා වැඩිවෙමින් පවතින ප්‍රවනතාවයක්තුළ එවැනි හිමිවරු පැවිදි ජීවිතය පිළිබඳව මනා අවබෝධයකින් තොරව හැසිරෙන බැවින් එම තත්වය බෞද්ධ සැදැහැවතුන්ගේ කලකිරීමටත් විවේචනයටත් භාජනයවූ අවස්ථාතිබේ. එසේම ශාසනයට අහිතකර බොහෝ දෑ කිරීමටපෙළඹීම නිසා සමාජ දෝෂ දර්ශනයට ලක්වන අවස්ථා දැකිය හැකිවේ. මේඅනුව, එවැනි හිමිවරුන්ට පැවිදි ජීවිතයේ ඇති උත්තරීතරභාවය හා ගිහි පැවිදි වෙනස පිළිබඳව මූලික වත් පිළිවෙත් හා ධර්මානුකූල දැනුමක් ද ලබා දීමට මෙම වැඩමුළුව පැවැත්වේ.

දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රාදේශීය ලේකම් මඟින් අදාළ බල ප්‍රදේශයේ විහාරස්ථානවල වැඩසිටින ළමාවිය ඉක්මවා පැවිදිවූ භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු කැඳවාගනු ලබයි. ලැබෙන තොරතුරු මත දිස්ත්‍රික්කයක් තුළ එක් වැඩසටහනක් හෝ දෙකක් පැවැත්වීම අපේක්ෂා කරනුලැබේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන්ගේ සහය ලබාගෙන උක්ත වැඩසටහන අදාළ දිස්ත්‍රික්කය තුළදී සංවිධානය කරනු ලබන අතර, එක් වැඩසටහනක් සඳහාඅවම භික්ෂූන්වහන්සේලා 10 නමක් අපේක්ෂා කෙරේ.

2018 වර්ෂයේ පැවැත් වූ වැඩසටහන් පිළිබඳ විස්තර

දිස්ත්‍රිකය	ස්ථානය	සම්බන්ධීකරණය	මෙහෙයවීම	දිනගණන	සහභාගී වූ භික්ෂූවරු සංඛ්‍යාව
ගාල්ල	කොස්ගොඩ සදහම් මැදුර	ගාල්ල දි.ලේ. කාර්යාලය බලපිටිය ප්‍රා. ලේ. කාර්යාලය	පූජ්‍ය කහගල සාරානන්ද ස්වාමීන්වහන්සේ	3	10
ගාල්ල	බද්දේගම කිඹිඇල භික්ෂු විවේකාගාරය	ගාල්ල දි.ලේ. බලපිටිය ප්‍රා.ලේ.	පූජ්‍ය බඹරවානේ තිලකරතන ස්වාමීන්වහන්සේ	3	13

මේ සඳහා මෙම වසරේ රු 170,499.00 වැය කර ඇත.

05 ඉදිරි ඉලක්ක

2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	2019 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක
1.	සාමණේර ආයතන පවත්වාගෙන යාම සඳහා මූල්‍යාධාර ලබා දීමේ වැඩසටහන	• සාමණේර ආයතන 10 ක් සඳහා රු. 4,387,000/= මූල්‍යාධාර දීම අපේක්ෂා කෙරේ.
2.	සම්බුද්ධත්ව ජයන්ති කැපකරු ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය	• සාමණේර භික්ෂූවරුන් 1000 නමකට ශිෂ්‍යාධාර ලබාදීමට ඉලක්ක කර ඇත.
3.	දිවයින පුරා වැඩසිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් ආරම්භ කිරීම	• දිවයින පුරා වැඩසිටින සුදුසුකම්ලත් භික්ෂූන් වහන්සේලාගෙන් ප්‍රාදේශිය ලේකම් හා ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී භික්ෂූන්ගේ නිර්දේශයෙන් හා වෛද්‍ය නිර්දේශය මත භික්ෂූන් වහන්සේලා වැඩි සංඛ්‍යාවක් වෙත වෛද්‍යාධාර ලබාදීම.

4	වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලා සඳහා පැවිදි ජීවිතය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම	• වැඩසටහන් සංඛ්‍යාව 4කි.
5	බුදුපුත් සුරක්ෂා වැඩසටහන	• මෙම අමාත්‍යාංශයේ ලියාපදිංචි හිමිකම් පතක් සහිත වෙනත් රක්ෂණ ක්‍රමයකින් ආවරණය නොවන ස්වාමීන් වහන්සේලා රෝහල් ගත වීමේදී - වෛද්‍ය පරීක්ෂණ ගාස්තු - වෛද්‍ය ගාස්තු - ඖෂධ ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම.

06. මූල්‍ය කළමනාකරණය

බුද්ධශාසන අරමුදල
2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
6.1 ආදායම් වියදම් ගිණුම්

ආදායම්

	සටහන	2018	2017
		රු. ශ	රු. ශ
ආදායම			
ආයෝජන ආදායම			
ධර්ම ග්‍රන්ථ අලෙවියෙන් ලාභ	4	54,726,946.34	52,172,259.95
පරිත්‍යාග සහ වෙනත් ආදායම්	5	298,277.00	211,843.77
	6	5,500.00	11,000.00
මුළු ආදායම් එකතුව		55,030,723.34	52,395,103.72
අඩුකළා : ව්‍යාපෘති වියදම්			
සාමණේර ආයතන ආධාර		1,090,000.00	1,365,000.00
සාමණේර ආයතන - අධීක්ෂණ වියදම්		80,597.00	40,703.00
සාමණේර කැපකරු දායක වාරික මුදල්		5,937,659.00	5,855,853.50
භික්ෂු වෛද්‍යාධාර		2,219,000.00	1,645,000.00
ද්‍රවිඩ දහම් පාසලට මූල්‍යාධාර		-	-
සනිපාරක්ෂක කටයුතු සඳහා මූල්‍යාධාර		3,000,000.00	-
උඩුදුම්බරවෙක්පත් බෙදාදීම		-	-
දානමය පිරිකර සඳහා ග්‍රන්ථ පරිත්‍යාග		-	-
සාමණේර ආයතන විභාග		506,535.00	754,304.00
වැඩිහිටි භික්ෂු ආකල්ප ප්‍රවර්ධන වැඩසටහනට වියදම්		170,499.00	112,418.76
චීන භාෂා වියදම්		257,975.00	
පරිපාලන වියදම්			
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා		500.00	24,905.00
පාලක මණ්ඩල පාරිශ්‍රමික දීමනා හා කාර්ය මණ්ඩල වැටුප්		89,163.75	16,819.00
ගමන් වියදම්		13,630.00	38,870.00
පරිගණක පුහුණු දීමනා		214,560.00	151,500.00
උපයන විට ගෙවූ බදු		-	-
අතිකාල		5,136.00	17,112.00
සංග්‍රහ වියදම්		6,085.00	11,571.00
ග්‍රන්ථ ප්‍රවාහන වියදම්		-	-
කම්කරු කුලී			
වියදම්		-	-
වෙනත් වියදම්		18,672.00	-
භික්ෂු පුහුණු වැඩසටහන		43,634.00	-
විවිධ ක්ෂය වෙන්කිරීම්	1		
සේප්පුව		4,310.00	4,310.00
ගොඩනැගිලි ඉදිකිරීම්		87,500.00	87,500.00
ලී බඩු උපකරණ ක්ෂය		5,775.00	5,775.00
ශබ්ද විකාශන යන්ත්‍රය		5,735.00	5,735.00
උපකරණ සහ සවි කිරීම්		16,294.00	16,294.00
පෙත් හානි		-	-

	13,773,259.75	10,153,670.26
වියදමවල එකතුව	41,257,463.59	42,241,433.46
වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)		

2020/7/27
ජී.එන්.ශ්‍රීණවීර
ගණකාධිකාරී
බුද්ධශාසන අරමුදල

2020/7/27
ඩබ්.ටී.එච්. රුවිර විතාන
ලේකම්
බුද්ධශාසන අරමුදල

2020/7/27
එම්.කේ. බන්දුල හරිස්චන්ද්‍ර
ලේකම්, බුද්ධ ශාසන අමාත්‍යාංශය
බුද්ධ ශාසන අරමුදලේ
පාලක මණ්ඩල සාමාජික

ඩබ්. ටී. එච්. රුවිර විතාන
ලේකම්
බුද්ධශාසන අරමුදල
"දහම්පාය",
අංක 135,
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

6.2

බුද්ධශාසන අරමුදල

2018-12-31 දිනට ශේෂ පිරික්සුම

	හර	බැර
සේප්පුව	රු ශ	රු ශ
කාර්යාලිය ගෘහ භාණ්ඩ	57,456.00	
සවි කිරීම් හා කාර්යාල උපකරණ	57,750.00	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත්	162,940.00	
ආයෝජන ලංකා බැංකුව	183,964,000.00	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කැපකරු දායක ව්‍යාපෘතිය යටතේ	34,066,268.74	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමණේර ආයතන ව්‍යාපෘතිය	41,064,700.00	
භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය (ලංකා බැංකුව)	35,955,701.26	
මහජන බැංකුවේ ස්ථාවර තැන්පත්	86,770,604.86	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෛද්‍යාධාර ව්‍යාපෘතිය	123,957,924.09	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අංක 01125 ඉතිරි කිරීමේ ගිණුම	15,000,000.00	
ශබ්ද විකාශන යන්ත්‍රය	10,204,350.03	
ඉඩම	45,885.00	
අනුරාධපුර ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම	7,000,000.00	
බුද්ධ ජයන්ති කාසි තොගය	3,500,000.00	
විවිධ බෞද්ධ ග්‍රන්ථ	317,400.00	
පාලි ටීකා සිංහල පරිවර්තන	1,094,626.49	
2600 Years of Buddhism ග්‍රන්ථය	2,070,999.38	
පොත් විකුණුම් පිරිවැය	5,486,880.00	
නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් පොත් විකුණුම්	1,720,234.50	
පාලි ටීකා ඉංග්‍රීසි පරිවර්ථනය සඳහා නැදිමාල බෞද්ධ	7,988,635.88	
විකුණුම් සඳහා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඇති පොත්	1,080,165.00	
ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී	3,955,745.33	
ලැබිය යුතු ජාතික ඉතිරි කිරීමේ බැංකු පොලිය	3,281,469.08	
සාමනේර කැපකරු ව්‍යාපෘති පොලී	14,199,154.18	
සාමණේර ආයතන ව්‍යාපෘති ලැබිය යුතු පොලී		4,241,013.74
ජාතික ඉතිරි කිරීම් සෘජු තැන්පත් ලැ/යු පොලී	1,595,278.74	
ජා.ඉ.බැංකුව - වෛද්‍යාධාර ස්ථාවර තැන්පතු ලැබිය යුතු පොලී	0.00	
මහජන බැංකුවේ ස්ථාවර තැන්පත් ලැබිය යුතු පොලී	457,397.26	
සාමනේර ආයතන ව්‍යාපෘති පොලී ලැබීම්	10,373,350.50	
රාජකීය ආසියාතික සංගමය		3,531,366.27
පොලිය මත රදවාගත් උපයනවිට ගෙවීම් බදු	7,282.00	
අත්තිකාරම්	1,154,845.51	
මහ බැංකුව	-1,644.00	
ලංකා බැංකුව	34,026,595.13	
ගෙවිය යුතු සාමණේර ආයතන දීමනා	135,872.20	
ගෙවිය යුතු සාමණේර කැපකරු ශිෂ්‍යාධාර		187,500.00
පාලි ටීකා සඳහා නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයට		0.00
2600 Years of Buddhism පොත සඳහා ලිපි සැපයීම වෙනුවෙන්		544,409.50
ණය ආධාර		1,168,025.00
		1,348,796.00

		580,519,427.52
බුද්ධශාසන අංශුදල		30,430.65
ජාතික ඉතිරි කිරීමේ ගිණුම් අංක 100011259873 පොලී		342,435.25
ජාතික ඉතිරි කිරීමේ ගිණුම් අංක 100010101125 පොලී	776,615.20	
ජාතික ඉතිරි කිරීමේ ගිණුම් අංක 100011259873	5,937,659.00	
සාමණේර කුටිකරු ශිෂ්‍යාධාර ගෙවීම්	1,090,000.00	
සාමණේර ආයතන ගෙවීම්	2,219,000.00	
භික්ෂු වෛද්‍යාධාර ගෙවීම්	0.00	
ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම්	506,535.00	
සාමණේර ආයතන විභාග ගිණුම්	170,499.00	
වැඩිහිටි භික්ෂු පුහුණු ව්‍යාපෘතිය		437,500.00
ගොඩනැගිලි සමුච්චිත ක්ෂය		34,480.00
සේප්පුව සමුච්චිත ක්ෂය වෙන්කිරීම්		28,875.00
ලි බඩු හා කාර්යාල උපකරණ සමුච්චිත ක්ෂය		28,675.00
ශබ්ද විකාශන යන්ත්‍ර සමුච්චිත ක්ෂය		81,470.00
සවි කිරීම් හා කාර්යාල උපකරණ ක්ෂය වෙන්කිරීම්	87,500.00	
ගොඩනැගිලි ක්ෂය	4,310.00	
සේප්පුව ක්ෂය	5,775.00	
ලි බඩු හා කාර්යාල උපකරණ ක්ෂය	5,735.00	
ශබ්ද විකාශන යන්ත්‍ර ක්ෂය	16,294.00	
සවි කිරීම් හා කාර්යාල උපකරණ ක්ෂය		19,952,967.89
ජා ඉ බැ සෘජු තැන්පත් පොලී		7,912,471.18
ලං බැ භාණ්ඩාගාර බිල්පත් පොලී		3,509,987.71
ලංකා බැංකු පොලී		13,578,054.47
මහජන බැංකු පොලී		1,628,219.18
වෛද්‍ය ආධාර		2,018,511.50
පොත් අලෙවි ආදායම		6,472,266.18
පරිත්‍යාග		5,500.00
පරිත්‍යාග ලැබීම්		
පරිත්‍යාග නිදහස් කිරීම්	0.00	
සාමනේර ආයතන අධීක්ෂණ මණ්ඩල දීමනා	80,597.00	
සංග්‍රහ වියදම්	6,085.00	
වෙනත් වියදම්	18,672.00	
මන් වියදම්	13,630.00	
ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම්	500.00	
පරිගණක දීමනා	214,560.00	
වාහන නඩත්තු	0.00	
බන්දන 300-3812	0.00	
තිකාල දීමනා	5,136.00	
ාලක මණ්ඩල වියදම්	27,069.00	
ාතික ඉතිරි කිරීමේ බැංකු කැපකරු ලැබියයුතු පොලී	758,903.52	
ංකා බැංකු ලැබියයුතු පොලී	1,536,646.42	
නභාෂා වියදම්	257,975.00	
කතුව		
	647,602,382.04	647,602,382.04

6.3

බුද්ධශාසන අරමුදල

2018.12.31 දිනට ශේෂ පත්‍රය

	සටහන	2018	2017
		රු. ශ	රු. ශ
වත්කම්			
ස්ථාවර වත්කම්			
ආයෝජන	1	10,213,031.00	10,332,645.00
මුදල් සංගම වත්කම්	2	531,760,164.17	503,954,295.10
	3	87,624,758.12	74,053,549.60
		629,597,953.29	**588,340,489.70**
අයිතීන් නියෝජනය වන්නේ;			
බුද්ධශාසන අරමුදල		621,776,891.11	580,519,427.52
විදේශ පරිත්‍යාග	4	6,472,266.18	6,472,266.18
සුභාම් ආධාර		1,348,796.00	1,348,796.00
		629,597,953.29	**588,340,489.70**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම සඳහා බුද්ධශාසන අරමුදලේ ඉදිරියේ රැස්වනු ලබන පළමු පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.

බුද්ධ ශාසන අරමුදලේ 2018.12.31 දිනට ඉදිරිපත් කර ඇති ශේෂ පත්‍රය සහ ගිණුම් ප්‍රකාශන සම්බන්ධ වගකීම බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩලය සතු වන්නේය.

2019/7/27
ඩී.එන්. ගුණවීර
අධ්‍යක්ෂ
බුද්ධ ශාසන අරමුදල

2019/7/27
ඩබ්.ටී.එච්. රුවිර විතාන
ලේකම්
බුද්ධශාසන අරමුදල
ඩබ්. ටී. එච්. රුවිර විතාන

2019/7/27
එම්.කේ. බන්දුල හරිශ්චන්ද්‍ර
ලේකම්, බුද්ධ ශාසන අමාත්‍යාංශය
බුද්ධ ශාසන අරමුදලේ
පාලක මණ්ඩල සාමාජික

ශ්‍රීමත් අභයාරාම...
කොළඹ 07.

6.4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

දිනය திகதி Date } 2022 පෙබරවාරි 11 දින

මගේ අංකය எனது இல. My No. } සිජප්/සි/බීඑස්එෆ්/01/ 2018/ එප්ප්

ඔබේ අංකය உமது இல. Your No. }

ලේකම්

බුද්ධශාසන අරමුදල

බුද්ධශාසන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

Acc
Atn (DO)
MA (VS)
Top Urgent

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 1. ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

BUDDHASASANA FUND
22 FEB 2022

17

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඒ/සී/බීඑස්එල්/01/2018/ එල්ඒ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 පෙබරවාරි 11 දින

ලේකම්
බුද්ධශාසන අරමුදල

බුද්ධශාසන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධශාසන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 12 වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරනු බව් මා දරන්නා වූ මතය වේ.

18

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 කත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) සෑම ගෙවීමක් සම්බන්ධයෙන්ම වවුචරයේ සඳහන් මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත්, නියැදි පරීක්ෂාවේදී රු.1,717,000 කට අදාල ගෙවීම් සම්බන්ධයෙන් ලබා ගත් බවට කුවිතාන්සි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සුනාමි ආධාර බැරකම් වශයෙන් රු.1,348,796 ක් සඳහා ශේෂය සනාථ කිරීමට අදාල සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

පිටුව 2|7

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

පිටුව 3 | 7

- අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හාවිතා කරන ලද ඖෂුම්කරන ප්‍රතිපත්තිවල සහ ඖෂුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- පිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ඖෂුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත පිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව සාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

සටහන 4|7

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගත්තා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනෘජුකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මූදල් රෙගුලාසි 396	2013 සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී අරමුදල විසින් නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකරන ලද එකතුව රු.56,863 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට මෙම වාර්තාවේ දිනය වන විටත් පියවර ගෙන නොතිබුණි.
(ii) මූදල් රෙගුලාසි 502 (2)	එකතුව රු. 10,213,031 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(iii)	මූදල් රෙගුලාසි 757 (2)	වර්තානය රු.8,652,506 ක් වූ බෞද්ධ කර්ම ඉන්ථ සමිතින්ටයෙන් සමීක්ෂණයක් සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොසිටුණි.
(අ)	2006 දෙසැම්බර් 22 දිනැති අංක පිඒත්/423 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූදල් වක්‍රලේඛයේ 15 ඡේදය මඟින් ඇතුළත් කරන ලද මූදල් රෙගුලාසි 877(2) (අ) රෙගුලාසිය	ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ දෙකකුත් මාස 08 ක කාල පරාවකින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සමස්ත පකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර නොමැති බව.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී රු.55,366,914 ක් අරමුදලේ ආදායම් ලෙස ලැබී තිබුණ ද එයින් රු.13,773,260 ක් එනම් සියයට 25 ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැයකර තිබුණි. තවද, වාර්ෂිකව අතිරික්ත වන මූදල් ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ආයෝජන වටිනාකම් රු.531,760,164 ක් විය. බුද්ධශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය කාර්යයන්

ඉදුව 6|7

සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ආ) එකතුව රු.13,031,828ක් වූ අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණද, ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව රු.1,087,447ක් වර්ෂ 06 කට සහ ඉතිරි රු. 11,944,381 ක් වර්ෂ 03 කට වඩා පැරණි ශේෂ බව අනාවරණය වූ අතර, එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) එකතුව රු.1,712,435 ක් වූ ජංගම වගකීම් ශේෂ දෙකක් සම්බන්ධයෙන් වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණද, ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව රු.544,409 ක් වර්ෂ 04 කට සහ ඉතිරි රු.1,168,025 ක් වර්ෂ 03 කට වඩා පැරණි ශේෂ වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

8වුව 7|7